නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර තැන්පත් 6ක ආයෝජන පොලී ආදායම රු.1,489,760ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව.	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුලත් පර්චස් 8.73ක් වූ ඉඩමක වටිනාකම රු.87,300ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර, අක්කර 1 රූඩ් 02 පර්චස් 34ක ප්‍රමාණයෙන් යුතු ඉඩම් 02 ක වටිනාකම රු.1,787,300ක් ගිණුම් ගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව.	වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2019 වර්ෂයේ ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගත කල රු.3,934,660 ක් වැරදීමකින් 2024 වර්ෂයේදී ද ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ගිණුමේ හා සමුච්චිත අරමුදල් ගිණුම්වල ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.

1.6.2 නොසැසඳුන පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ගිණුම් විෂයයන් 07ක මූල්‍ය ප්‍රකාශන සහ උපලේඛනවල ශේෂය අතර රු.5,060,159ක වෙනසක් නිරීක්ෂණය විය.	ඉදිරි වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ගිණුම් ශේෂ හා උපලේඛන ශේෂ අතර වෙනස්කම් නිවැරදි කළ යුතුය.

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
එකතු වටිනාකම රු. 763,426 ක් වූ ගිණුම් විෂයයන් 03ක් අදාල උපලේඛන, තක්සේරු වාර්තා හා සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	අදාල ස්ථාවර වත්කම්වල 1989 දෙසැම්බර් 31 දිනට ශේෂය හඳුනා ගැනීම සඳහා ලිඛිත තොරතුරු සොයාගත නොහැකි බැවින් ඒ සඳහා උපලේඛන ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති බව.	මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන ගිණුම් ශේෂයන් සනාථ කිරීමට උපලේඛන ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
i.	මු.රෙ. 104	2024 ජූලි 16 සිට සැප්තැම්බර් 27 දක්වා කාලය තුල මුදල් අයකැමි විසින් සිදුකර තිබුණු මුදල් වංචාව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණ පවත්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	අලාභයන් පිළිබඳව ප්‍රාරම්භක වාර්තාව 2024 ඔක්තෝබර් 02 දින ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස් විසින් මූලික විමර්ෂණයක් සිදු කරන ලෙස වයඹ ප්‍රධාන අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර, පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින්ද පරීක්ෂණයක් සිදුකරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
ii.	මු.රෙ. 571(2)	වසර 02 ඉක්ම වූ තැන්පතු නිරවුල් කිරීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	තවදුරටත් රඳවා ගැනීමට අවශ්‍ය නොවන තැන්පතු නිරවුල් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2019 ජනවාරි 10 දිනැති අංක 2/2019 දරන පලාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය 05 වගන්තිය	සභාව සතු ගොඩනැඟිලි 03ක බදු කාලය අවුරුදු 04ත් - 08ත් අතර කාලයක් පසු වී තිබුණත් කඩ කාමර කුලිය තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.	කඩ කාමර කුලී යාවත්කාලීන කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් මේ වන විට ඉල්ලීම් යොමු කර අදාල පියවර ගෙන ඇති බව.	චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.123,573,230 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.166,177,531 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරුතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදාය	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000	රු.'000
i.	වරිපනම් හා බදු	26,792	20,113	15,189	20,836	24,143	23,640	13,418	21,443
ii.	කුලී	30,103	25,935	25,810	4,903	31,949	24,369	21,159	4,955
iii.	බලපත්‍ර ගාස්තු	3,797	7,983	7,969	14	3,973	8,340	8,339	2
iv.	වෙනත් ආදායම්	220,614	195,136	111,604	154,286	161,598	118,626	117,907	5,934
	එකතුව	281,306	249,167	160,572	180,039	221,663	174,975	160,823	32,334

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම් හා බදු		
i. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ආදායම රු.20,018,742ක් වූ අතර හිග කාලය වසර 5 ඉක්ම වූ වරිපනම් බදු ශේෂය රු.4,680,454ක් විය.	හිඟ මුදල් අය කර ගැනීම වෙනුවෙන් ජංගම වැඩසටහන් හා දේපළ තහනම් කිරීමේ වැඩසටහන් මේ වන විටත් පවත්වා අය කර ගනිමින් ඇත. එම හිඟ මුදල් වටිනාකම තවදුරටත් අවම කිරීම සඳහා ගෙයින් ගෙට ගොස් ගාස්තු එකතු කිරීමේ සුවිශේෂී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති බව.	හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

ii.	වර්ෂ 5කට වරක් වරිපනම් ප්‍රතිශෝධනයක් කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව අනුව සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකර තිබුණි.	සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයක් 2019 වර්ෂයේදී සිදු කර ඇති අතර පැවති විවිධ දේශපාලනික, සමාජීය හා ආර්ථික බලපෑම් හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වුවද 2025 වර්ෂයේ සිට එය ක්‍රියාත්මක කර ඇති බව.	වරිපනම් තක්සේරුව කාලීනව සිදු කළ යුතුය.
iii.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ආදායම රු.813,247ක් වූ අතර හිඟ කාලය වසර 05 ඉක්ම වූ අක්කර බදු ශේෂය රු.463,373 ක් විය.	අක්කර බදු ඒකක බොහෝමයක් නිහඩ ඒකක වේ. ඒ අනුව ඒ පිළිබඳව සමාලෝචනය කර සාධාරනීකරණ වාර්තාවක් සමග එම හිඟ ඒකක නිරවුල් කිරීමට කටයුතු කරන බව.	හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
iv.	වර්ෂ 05කට වරක් බල ප්‍රදේශයේ සමීක්ෂණයක් සිදු කර අක්කර බදු අයකර ගත හැකි ඉඩම් හඳුනා ගැනීමට සභාව පියවර ගෙන නොතිබුණි.	අක්කර බදු ඒකක බොහෝමයක් මේ වන විට වෙනත් ඒකක වෙත පරිවර්ථනය වී ඇති අතර ඒ පිළිබඳව සමීක්ෂණය කිරීමේ කාලීන අවශ්‍යතාවයක් පැවතියද කාර්ය මණ්ඩල ගැටළු හේතුවෙන් මෙය ක්‍රියාත්මක කිරීම අපහසු වී ඇති බව.	කාලීනව සමීක්ෂණ සිදුකොට අක්කර බදු අයකළ හැකි ඉඩම් හඳුනාගෙන අක්කර බදු අය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	**කුලී** 2025 මාර්තු 31 දිනට හිඟ කඩකුලී හා බදු කුලී ආදායම රු.4,177,367ක් වූ අතර හිඟ කාලය වසර 05 ඉක්මවූ කුලී ශේෂය රු.365,356 ක් විය.	මෙම හිඟ මුදල් අය කර ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතින බව.	හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්** 1999 - 2024 කාලයට අදාල ආදායම් විෂයන් 07 ක හිඟ ආදායම් රු.660,319ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	පළාත් පාලන සේවක සංගමය අක්‍රිය බැවින් ලබාදී ඇති ණය මුදල සඳහා පොළිය රු.10,836ක් කපා හැරීමට පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් විමසා ඇති අතර, ඉතිරි මුදල් හා අනෙකුත් හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව.	අයවිය යුතු වෙනත් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතියකින් තොරව නාත්තන්ඩිය වට රවුම අසල 2019 වර්ෂයේ දී රු.3,698,760ක් වැය කර ඉදිකර තිබුණු ආහාර අලෙවිසැල ඉදිකිරීම සඳහා යොදා ගෙන තිබුණු යකඩ බාර් දිරීමට ලක්වීම හේතුවෙන් 2025 වර්ෂය සඳහා බදු දීමට නොහැකි වී තිබුණි.	මෙම ප්‍රදේශයේ පවතින ලුණු මිශ්‍ර සුළං ප්‍රවාහ මගින් වන යකඩ මල බැදීම ඉක්මන් වන බැවින් ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව.	ගොඩනැගිල්ල අලුත්වැඩියා කර ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය.
(ආ)	ප්‍රදේශයේ දරුවන්ගේ දැනුම හා අධ්‍යාපන කටයුතු පහසු කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ රු.1,377,215ක් වැයකර ඉදිකර තිබුණු මුදුකටුව කියවීම් ශාලාව දරුවන් විසින් පරිහරණය නොකරන නිශ්කාර්ය වත්කමක් බවට පත් වී තිබුණි.	මෙය දරුවන්ගේ පරිහරණය සඳහා අවශ්‍ය පරිදි සකස් කර ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව.	කියවීම් ශාලාව ප්‍රයෝජනයට ගන්නා ආකාරයට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුය.
(ඇ)	සභාවට අයත් දුන්කන්නාව විද්‍යුත් පුස්තකාලයේ සේවා සැපයීම සඳහා 2020 වර්ෂයේ දී පුරනැගුම ව්‍යාපෘතිය මගින් සපයා තිබුණු රු.912,000ක් වටිනා පරිගණක හා උපාංග උපයෝජනය අවම මට්ටමක පැවති අතර, පුස්තකාලයාධිපති සතියට දින 03ක් පමණක් සේවයට පැමිණෙන බැවින් පූර්ණ කාලීන පුස්තකාලාධිපතිවරයකු නොමැති වීම පුස්තකාලයේ සේවය ප්‍රශස්ත මට්ටමින් ලබා දීමට බාධාවක් වී තිබුණි.	ලැබී ඇති පරිගණක යන්ත්‍ර භාවිතා කරමින් පරිගණක පාඨමාලා කිහිපයක් ආරම්භ කිරීම වෙනුවෙන් අනුමැතිය ඉල්ලා ව්‍යාපෘති යෝජනාවක්ද ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති අතර, ඒ සඳහා අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය කර අදාල පාඨමාලා පැවැත්වීමට උපදෙස් ලැබී ඇත. එහෙත් අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම තවදුරටත් සිදු නොවීම තුළ පරිගණක පාඨමාලා ආරම්භ කර නොමැති බව.	පුස්තකාලයෙන් බල ප්‍රදේශයේ ජනතාවට ප්‍රශස්ථ සේවයක් සැපයීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු ගිණුම් ශේෂ වටිනාකම රු133,017,835ක් වූ අතර එය තුළ අවුරුදු 03කට වැඩි රු.10,199,253ක් ද පැවතුණි. මෙම ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව.	ගෙවිය යුතු ශේෂවල පැවැත්ම සොයා බලා කඩිනමින් නිරවුල් කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 මාර්තු මාසයේ රු.348,290 ක් වැය කර ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ස්ථාපිත කර තිබුණු කැමරා පද්ධතිය අක්‍රිය වී තිබුණි. කැමරා පද්ධතිය අක්‍රීය වීම හා අස්ථානගත වූ උපකරණ සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 102, 103, 104 රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ CCTV කැමරා පද්ධතිය සම්බන්ධ වන විමසුමට අදාලව CCTV පද්ධතියේ කොටස් අලුත්වැඩියාව සඳහා ලබා දුන්නේ කාටද? කවුරුන් විසින් ලබා දුන්නේද? යන්න මේ වන විටත් තහවුරු කර ගැනීමට නොහැකි වූ බැවින් මේ සම්බන්ධව පරීක්ෂා කර කරුණු වාර්තා කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මළ අපද්‍රව්‍ය නිසි ලෙස කලමනාකරණය හා පරිසරයට සිදුවන හානිකර බලපෑම් අවම කිරීම සඳහා රු.1,214,198ක් වැය කර 2017 වර්ෂයේ ඝන අපද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථාන පරිශ්‍රයේ ඉදිකර තිබුණු පද්ධතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව වසර 07කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි.	ඒ සම්බන්ධයෙන් කරුණු සොයා බලා අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව.	මළ අපද්‍රව්‍ය කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක මට්ටමට පත් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තියට අනුව සුසාන භූමි හා මිනීපිටි ආඥා පනතේ 03 වන වගන්තියේ කාර්යය සඳහා බල ප්‍රදේශයට අයත් සේ සැලකෙන සුසාන භූමි 15ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි.	මෙතෙක් සභාව වෙත පවරා නොගත් සුසානභූමි සම්බන්ධයෙන් පරික්ෂා කර ඉදිරි වර්ෂයේදී අදාල පවරා ගැනීම් සඳහා ක්‍රියාමාර්ග ගන්නා බව.	අදාළ දේපළවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.
(ආ)	සභා ප්‍රධාන කාර්යාලය, නගර ශාලාව සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ 2024 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අයිතම වර්ග 17 ක	අයිතම 17ක ඒකක 79ක ඌනතාවයක් පැවති බැවින් එම ඒකක 79 පිළිබඳව නැවත පරීක්ෂා කර එම තොරතුරු නිවැරදි කරන බව.	භාණ්ඩ ඌනතා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය.

	ඒකක 79 ක ඌණතාවයක් පැවතුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.		
(ඇ)	සභා බල ප්‍රදේශයට අයත් මහගෙදර වත්ත නැමති ඉඩම 2003 වර්ෂයේ කැබලි කර අලෙවි කිරීමේ දී අක්කර 01 රූඩ් 03 පර්චස් 29.07 ක් හා රූඩ් 01 පර්චස් 16 ක් වූ බිම් කොටස් 02ක් පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කර දී තිබුණද 2025 මාර්තු අවසන් වන විටත් ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	කෙටුම්පතෙහි අදාල පොදු ඉඩමේ කැබලි අංක නිවැරදි නොවීම මත ලියාපදිංචි නොකර ඇති බව පෙනී යයි. ඒ අනුව දැනට අදාල ආයතනය ක්‍රියාකාරිව පවතී නම් එම ආයතනය හරහා මෙම ලියාපදිංචිය සිදු කර ගැනීමට කටයුතු කරන බව.	ඉඩමේ අයිතිය පවරා ගත යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	සභාවේ ද්විතීයික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 19 ක්ද, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවල පුරප්පාඩු 20ක්ද පැවතුණු අතර, තාක්ෂණ නිලධාරී සහ ආදායම් පරීක්ෂක තනතුරුවල පිළිවෙලින් නිලධාරීන් 03ක හා 04ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් ඉදිකිරීම් හා නඩත්තු කටයුතු, අනවසර ඉදිකිරීම් හා මහජන පැමිණිළි පිළිබඳ පරීක්ෂාවන් කාලීනව ඉටු කිරීමට නොහැකි වී තිබුණු අතර ආදායම් අයකර ගැනීමට නොහැකි වීමෙන් හිඟ ආදායම් ඉහල යාමේ ප්‍රවණතාවයක් ඇති වී තිබුණි.	පුරප්පාඩු තනතුරු සම්බන්ධයෙන් 2025 කාර්ය මණ්ඩල සමාලෝචනය සඳහා මේ වන විට තොරතුරු ඉදිරිපත් කර ඇති බව.	තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරගෙන සභාවේ කාර්යයන් බාධාවකින් තොරව පවත්වාගෙන යා යුතුය.
(ආ)	2010 – 2024 කාලය තුල සේවය හැර ගිය, මියගිය, සෞඛ්‍ය හේතු මත විශ්‍රාම ගිය , සේවය අවසන් කල හා වැඩ තහනම් කල සේවකයින් හා නිලධාරීන් 36 ක ගෙන් රු.1,302,073ක් අය වීම ඇණහිට තිබුණි. මෙම ණය ශේෂ අයකර ගැනිමට සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	සේවය අතහැර ගොස් ඇති සේවකයින් සම්බන්ධ තොරතුරු සභාව සතුව නොමැති නිසා මෙම හිගය අයකර ගැනීමේ හැකියාවක් නොමැති බැවින් කපා හැරීමට ඉල්ලීම් කළත් පළාත් පාලන කොමසාරිස් අනුමැතිය ලබා දී නොමැති බව හා අනෙකුත් හිග ශේෂයන් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බව.	සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සෝගාතකාගාරයක් ඉදිකිරීම සඳහා 2002 වර්ෂයේදී පුද්ගලයින් 04 දෙනෙකු වෙත ලබාදුන් රු.450,000ක මුදල අදාල කර්තව්‍යයට සම්බන්ධ නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස 2016 ඔක්තෝබර් 13 දිනැති ගිණුම්කාරක සභාව මගින් උපදෙස් ලබාදී තිබුණද මේ දක්වා එම මුදල අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධ නඩු අංක 61156, 61157, 61158 දරණ නඩු වල විත්තිකරුවන්ට එරෙහිව අදාල මුදල අය කර ගැනීමට මාරවිල මහේස්ත්‍රාත් අධිකරණය වෙත මෝසමක් මඟින් විවෘත වරෙන්තු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව.	ගිණුම්කාරක සභා නියෝග අනුව කටයුතු කළ යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
වැය ශීර්ෂ 102ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්කර තිබුණු රු.13,050,461ක සම්පූර්ණ ප්‍රතිපාදනයම අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි.	විශේෂයෙන් පසුගිය වර්ෂයේ මැතිවරණ පැවැත්වීම හේතුවෙන් වැඩසටහන් බොහොමයක් සිදු නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	අයවැය ගත ඉලක්ක සපුරා ගැනීමට හැකි අයුරින් මෙහෙයුම් කටයුතු සැලසුම් කළ යුතුය.

4.3 තිරසර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 16ක් හඳුනාගෙන එම අරමුණු ළඟා කර ගැනීමේ වැඩසටහන් 51ක් 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. සැලසුම් කල ක්‍රියාකාරකම් වලින් 10ක් හෙවත් සියයට 22 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	එම කාලයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය මත සැළසුම් කළ පරිදි එම වැඩසටහන් ඉටු කිරීමට නොහැකි විය. එබැවින් එකී කර්මාන්ත ණයහිමි කළ අතර මේ වන විට එම කටයුතු අවසන් අදියරෙහි පවතින බව.	තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.